අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/21/01/5/1
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2020.07. 21

චක්‍රලේඛ අංක - 20/2020

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
විභාග කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්
ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්
සියලුම විදුහල්පතිවරුන්
සියලුම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා
සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල් ප්‍රධානීන්
සියලුම උපකෘත හා විශේෂ පාසල් විදුහල්පතිවරුන්
සියලුම ජාත්‍යන්තර පාසල් ප්‍රධානීන්

**අධ්‍යාපන ආයතන පරිශ්‍රයන් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය, ප්‍රවර්ධනය සහ වෙළඳාමෙන් තොර කලාපයක් බවට පත් කිරීම**

උක්ත කරුණට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 28/2012 හා 2012/08/30 දිනැති පාසල් පරිශ්‍රය දුම්වැටි, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර කලාපයක් බවට පත් කිරීමේ චක්‍රලේඛය අභිබවා මින් ඉදිරියට මෙම චක්‍රලේඛයේ විධිවිධානයන් බලපැවැත්වේ.

02. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනයන්හි, ආයතන පරිශ්‍රයන් සහ ජාත්‍යන්තර පාසල් පරිශ්‍රයන් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය, අලෙවිය හෝ ප්‍රවර්ධනය සහ ඒවාට සම්බන්ධ ආයතනවලින් අනුග්‍රහය ලබාගැනීම මේ මගින් තහනම් කෙරේ. නීත්‍යානුකූල සහ නීත්‍යානුකූල නොවන දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන , මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය හෝ මත්වීම සඳහා භාවිත කරන වෙනත් ඕනෑම ද්‍රව්‍යයක් මේ යටතට ගැනේ.

03. පාසල් දරුවන් හෝ පාසල් ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ඍජුව මෙන්ම වක්‍ර ආකාරයෙන් සිදුවන මත්ද්‍රව්‍ය ප්‍රචාරණයන් සහ විකිණීම වැළැක්වීම සඳහා අධ්‍යාපන ආයතන ප්‍රධානීන්ට, විදුහල්පතිවරුන්ට සහ අධ්‍යාපන බලධාරීන්ට අවශ්‍ය මගපෙන්වීම මෙම චක්‍රලේඛය මගින් සිදුවේ. එසේම ආයතන සංග්‍රහයේ II කොටස අනුව සහ රටේ පොදු නීතිය අනුව කටයුතු කළ යුතු වේ.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832 | +94112784825 | minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk

4.0 චක්‍රලේඛය බලපානු ලබන ආයතන, පුද්ගලයින් හා කණ්ඩායම්

4.1 අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල, රජයේ පාසල් (ගුරු නිවාස, ශිෂ්‍ය නේවාසිකාගාර, පාසල් ආපනශාලා ඇතුළු), දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය ඇතුළු ගුරු මධ්‍යස්ථාන, උපකෘත හා විශේෂ පාසල්, පිරිවෙන්, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, ගුරු විද්‍යාල, යන අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතන සහ ජාත්‍යන්තර පාසල් සඳහා අදාළ වේ.

4.2 ආයතන පරිශ්‍රයේ සිටින අවස්ථාවල දී සහ ආයතනයේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධව සිටින අවස්ථාවන්වල දී සියලුම ආයතන ප්‍රධානීන් ඇතුළු අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය, විදුහල්පතිවරුන්, ගුරුවරුන්, පාසල්වල අනධ්‍යයන කාර්යමණ්ඩලය, ගුරු අභ්‍යාසලාභීන්, සියලුම සිසුන්, පුහුණු කරුවන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යයන්, ඉදිකිරීම් කොන්ත්‍රාත් කරුවන්, කම්කරුවන් සහ වෙනත් ඕනෑම අයෙකු සඳහා අදාළ වේ.

05. චක්‍රලේඛය බලපානු ලබන අවස්ථා

ආයතනික පරිශ්‍ර තුළ දී, ආයතනික අනන්‍යතාවය සහිතව විෂය කටයුතු හෝ ඉන් පරිබාහිරව සහභාගී වන ඕනෑම අවස්ථාවක, බාහිර පුද්ගලයින් හෝ ආයතන ආයතනික කටයුතුවලට සම්බන්ධ කර ගැනීමේ දී, ආයතනික දේපල පරිහරණය කිරීමේ දී සහ එසේ කිරීමට අවස්ථාව ලබා දීමේ දී

උදා-: අන්තර් පාසල් ක්‍රිකට් තරඟාවලි පැවැත්වෙන අවස්ථාවල දී
අධ්‍යාපන හා විනෝද චාරිකාවල දී
විෂය සමගාමී ක්‍රියාකාරකම් සිදුකරන අවස්ථාවල දී
පාසල් පරිශ්‍රයේ බාහිර පාර්ශවයන් විසින් සංවිධානය කරනු ලබන ක්‍රීඩා, සැණකෙළි, ප්‍රදර්ශන හා සංගීත සංදර්ශන

06. ඉහත කොන්දේසි හා නියමයන් පිළිපැදීම සම්බන්ධව සියලුම සිසුන්/ අභ්‍යාසලාභීන්/ නිලධාරීන්/ දෙමාපියන් දැනුවත් කිරීම විදුහල්පතිගේ/ ආයතන ප්‍රධානීන් ගේ වගකීම වන අතර පාසලට/ අධ්‍යාපන ආයතනයට/ බාහිරින් පැමිණෙන පුද්ගලයින් ද මෙම කොන්දේසි අනුගමනය කළ යුතුය. එසේ නොවන අවස්ථාවල දී එය පාසලේ/ අධ්‍යාපන ආයතනයේ විනය නීති කඩකිරීමක් ලෙස සැලකිය යුතුය.

07. මෙම චක්‍රලේඛයේ විධිවිධාන උල්ලංඝනය වන ආකාරයට සිදුවන කවර ආකාරයක හෝ ක්‍රියාවක් හෝ කාර්යයක් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා සම්පූර්ණ වාර්තාවක්/ පොලිස් පැමිණිලි පිටපතක් නීතිමය පියවරක් ගැනීම සඳහා අධ්‍යාපන ලේකම් වෙත එවීමට කටයුතු කළ යුතු වේ. මෙහි අවසන් වගකීම අධ්‍යාපන ලේකම් සතුවේ. තම ආයතනයේ මෙම කොන්දේසි කඩ කරමින් කටයුතු කරන්නන් පිළිබඳ මෙහි ප්‍රතිපාදන ආශ්‍රයෙන් තීරණ ගත යුතු අතර ආයතන සංග්‍රහයට හා මෙරට පවතින නීති පද්ධතියට අනුව අදාළ වැරදි සඳහා නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු යෙදීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ.

08. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සෑම පාසලකම/ ආයතනයකම විදුහල්පතිගේ/ ආයතන ප්‍රධානියාගේ අනුශාසකත්වයෙන් සහ සියලු පාර්ශවයන්ගෙන් සමන්විතවන පරිදි මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් කමිටුවක් පිහිටුවිය යුතු අතර එහි වගකීම නියෝජ්‍ය විදුහල්පතිවරයෙකුට/ නිලධාරියෙකුට පැවරිය යුතුය. පාසල්/ ආයතන පරිශ්‍රය මත්ද්‍රව්‍ය භාවිතය අධෛර්යමත් කරන කලාපයක් බවට පත්කිරීම, මත්ද්‍රව්‍ය, දුම්වැටි හා මද්‍යසාර භාවිතයට හසුනොවීමේ කුසලතා වර්ධනය වන ආකාරයේ භෞතික පරිසරයක් තහවුරු කිරීම, අවබෝධයෙන් යුතුව තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සහ තමාට සහ සමාජයට අහිතකර දේ ප්‍රතික්ෂේප කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම උදෙසා ක්‍රියාකාරකම් සිදුකළ යුතුය.

09. සමස්ථ පාසල් දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමේ හා සමාජය මෙම උවදුරින් ගලවා ගැනීමේ ජාතික අවශ්‍යතාවය පෙරදැරිකරගෙන මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු නිසි පරිදි ක්‍රියාත්මක කර පාසලේ/ අධ්‍යාපන ආයතනයේ සියලුම සාමාජිකයින්ගේ සෞඛ්‍ය ආරක්ෂාව මෙන්ම රටේ අනාගතය සුරක්ෂිත කරලීම ඔබගේ වගකීම මෙන්ම යුතුකම බව ද අවධාරණය කරමි. එමෙන්ම චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම විදුහල්පති/ ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර ඒ අනුව කටයුතු සිදුකරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එන්.එච්.එම්.චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

1) ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය, - කාරු. දැ.ගැ.ස
2) ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කාරු. දැ.ගැ.ස
3) ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය - කාරු. දැ.ගැ.ස
4) විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කාරු. දැ.ගැ.ස
5) සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කාරු. දැ.ගැ.ස
6) නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව - කාරු. දැ.ගැ.ස
7) සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, - කාරු. දැ.ගැ.ස
8) සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - කාරු. දැ.ගැ.ස
9) ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. අ.ක.ස
10) අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික පාසල් ශාඛාව - කරු. අ.ක.ස
11) අධ්‍යාපන අධ්‍යක්ෂ, නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන - කරු. අ.ක.ස